**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාවට පරිත්‍යාග ලෙස ලද වටිනාකම රු.8,500,000 ක් වූ අංක WP LL-7074 දරන ටිපර් රථය සහ සභාව සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.306,200 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම රු.8,500,000 කින්, ලී බඩු හා කාර්යාල උපකරණ ගිණුම රු.306,200 කින් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.8,806,200 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී අංක PF-3407 දරන සභා කැබ් රථය සඳහා සවි කරන ලද උපාංග වෙනුවෙන් දරන ලද රු.313,000 ක වියදම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් ලෙස නොදක්වා පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.313,000 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඇ) ඉදිරි වර්ෂය සඳහා දරන ලද රු.212,412 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු.206,758 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළදී රු.2,000,000 ක් වැයකර තාර බැරල් 59 ක් සහ ටයර් මිලදී ගැනීම් කර තිබුණ ද, දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් සමිතිවලට තාර නිකුත් කිරීමෙන් ලැබිය යුතු රු.3,350,071 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් එම ප්‍රමාණයෙන් ණයගැතියන් අඩුවෙන් දැක්විණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.3,658,873 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ දී මිලදී ගන්නා ලද සමාලෝචිත වර්ෂයේ ජනවාරි 29 දින ගෙවීම් කළ රු.59,000 ක් වටිනාකම වූ කැසට් යන්ත්‍ර 10 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.2,331,625 ක් වුවද, වර්ෂයේ ආදායම් ලෙස රු.2,604,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.272,375 කින් වැඩියෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 40 ක් සඳහා ලැබිය යුතු මූලධන ආධාර මුදල රු.26,743,772 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.54,931,333 ක් ලෙස දැක්වීමෙන් රු.28,187,561 කින් ණයගැතියන් හා මූලධන ආදායම් වැඩියෙන් දැක්විණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 32 ක් සඳහා ගෙවිය යුතු මුදල රු.24,764,130 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.33,719,583 ක් ලෙස දැක්වීමෙන් රු.8,955,453 කින් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දැක්විණි.

(ඕ) සමාලෝචිත වර්ෂය සඳහා මීටියාගොඩ සතිපොල බිල් කිරීම රු.242,500 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.409,410 ක් ලෙස දැක්වීමෙන් ලැබිය යුතු කුලී හා ණයගැතියන් රු.166,910 බැගින් වැඩියෙන් දැක්විණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.746,065 ක වෙනසක් පැවතුණි.

(ආ) පාලන ගිණුම් අනුව අක්කර බදු ශේෂය රු.174,739 ක්, බදුකුලී ශේෂය රු.449,573 ක් සහ බලපත්‍ර ගාස්තු ශේෂය රු.49,650 ක් වුවද, උප කාර්යාලයේ උපයෝගී ලේඛන තුලනය කර නොතිබීමෙන් පාලන ගිණුම්වල ශේෂ උපයෝගී ලේඛන ශේෂ සමඟ සැසඳිය නොහැකි විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.211,282,570 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ශේෂ තහවුරු සහතික සහ ණයගැති හා ණයහිමි උපලේඛන පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,379,205 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,660,949 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 වරිපනම් බදු**

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සභා බලප්‍රදේශයේ මාර්ග පද්ධති පහසුකම්, විදුලි පහසුකම්, දුරකථන පහසුකම්, ජල පහසුකම් හා ප්‍රාදේශීය සභාව විසින් කැලිකසල ඉවත් කිරීම කරනු ලබන පහසුකම් පවතින දියුණු කළ ප්‍රදේශ ලෙස සැලකිය හැකි බටපොල නගරය වැනි ප්‍රදේශ තිබියදීත් එම ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 අක්කර බදු**

------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතුව තිබූ රු.174,739 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.3 බදු කුලී**

**--------**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතුව තිබූ රු.449,573 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

-----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතුව තිබූ රු.49,650 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.3,140,260 ක උසාවි දඩ හා රු.13,341,606 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 බලය නොළත් ගනුදෙනු**

**---------------------------**

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා දෙකක් සඳහා සභාපතිවරයා සහ සභිකයින් 08 දෙනෙකු සහභාගීවීම වෙනුවෙන් රු.1,938,160 ක් ප්‍රාදේශීය සභා අරමුදලින් වැයකර තිබුණි. එසේම එකී විදේශ ගමන් සඳහා විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂයේ දී සභාපති, උප සභාපති හා සභිකයින් 09 දෙනෙකු විසින් 2015 ජනවාරි 26 වන විටද වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

**(අ) වීථි පහන් උපකරණ මිලදී ගැනීම්**

-------------------------------------

2014 වර්ෂය තුළ වීථි පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.1,305,044 ක් වැය කර තිබූ අතර, වීථි පහන් නඩත්තුව සඳහා රු.1,440,512 ක් වැයකර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වීජී පහන් සවි කිරීම පිළිබඳ උපදෙස් දැක්වෙන වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ 1998 මාර්තු 16 දිනැති අංක : පී.එෆ්./12/91 දරන චක්‍රලේඛය අනුව වීජී පහන් අළුතින් ස්ථාපිත කිරීමට පෙර ඒ පිළිබඳව අනුමැතිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබා ගතයුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව වීජී පහන් සවි කර තිබුණි.

(ii) 2012 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණ ද, කිසිදු දීමනාවක් සභාවට ලැබී නොතිබුණි.

(iii) 2013 සහ 2014 වර්ෂ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

**(ආ) ඉඩම් වෙන්දේසි**

**------------------**

2015 ජනවාරි 21 දින ගලගොඩබැද්ද ඉඩම, කුරුඳුවත්ත ඉඩම සහ රත්මැහැර වත්ත යන ඉඩම් වෙන්දේසි පිළිබඳව සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පොදු කටයුතු සඳහා සභාවට ලබා දී තිබූ ඉඩම් කැබලි අයෝග්‍ය ඉඩම් කැබලි බව නිරීක්ෂණය වූ අතර එම ඉඩම් කැබලිවලට අදාළ ඔප්පු සභාවට ලබා දී නොතිබුණි. එමෙන්ම ඉඩම්වල මාර්ග කොන්ක්‍රීට් කර නොතිබුණු අතර විදුලිය ද ලබා දී නොතිබුණි.

**3.4 නිෂ්ක්‍රීය වත්කම්**

--------------------

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ඉදිරි මාස 03 ක කාලයක් තුළ අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, සභා භූමියේ අත් ට්‍රැක්ටර් 02 ක් දිරාපත් වෙමින් පවතින බව 2015 ජනවාරි 24 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**3.5 හඳුනාගත් අලාභ**

**------------------**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුළදී 1" ගැල්වනයිස් බට 512 ක් සභාව වෙත ලබා දී තිබුණි. 2015 අප්‍රේල් 01 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී සභාව සතුව ගැල්වනයිස් බට 393 ක් පමණක් පැවති බව නිරීක්ෂණය විය. මේ අනුව සභාවට ලබා දී තිබූ 1" ගැල්වනයිස් බට 119 ක ඌනතාවයක් පැවතුණි. බට ඌනතාවයේ වටිනාකම රු.131,733 ක් විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ඇතැම් ආදායම් විෂයයන් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල වියදම් වැඩියෙන් දරා තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය